# සාමාන්‍ය සමයේ දහතුන්වන ඉරුදින

## පළමුවන දේව ප්‍රකාශනය 2 රාජාවලිය 4: 8–11, 14–16

*රාජාවලියේ දෙවන පොතෙන් උපුටා ගත් කොටසකි.*

"දෙවියන් වහන්සේට කැපවූ බැතිමත් මනුෂ්‍යයෙකු වන ඔහු මෙහි වෙසේවා."

එක් දවසක් එලිෂා ෂූනෙම් නම් දේශයට ගියේ ය. එහි සිටි ධනවත් ස්ත්‍රියක් කෑම කන්න ඔහුට පෙරැත්ත කළා ය. මෙසේ ඔහු යන එන සෑම විට ම කෑම කන පිණිස එහි නැවතිණි. ඈ ඇගේ පුරුෂයාට කතා කොට, "නිතර ම අප ළඟින් යන එන මොහු දෙවියන් වහන්සේට කැප වූ බැතිමත් මනුෂ්‍යයෙකු බව මට පෙනෙයි. අපි බිත්ති ඇති කුඩා උඩු මහලක් සාදා, ඇඳකුත්, මේසයකුත්, පුටුවකුත්, පහනකුත් එහි තබමු. එවිට ඔහු අප ළඟට ආ කල එහි සිටින්න පුළුවනැ"යි කීවා ය. එක් දවසක් එලිෂා එහි පැමිණ උඩු මහලට ගොස් නිදාගත්තේ ය. එලිෂා තම සේවක ගෙහාසිට කතා කොට "ඈ උදෙසා කරන්න තිබෙන්නේ කිමෙක් දැ"යි ඇසීය. ගෙහාසි කතා කොට, "ඇට පුත්‍රයෙක් නැත, ඇගේ පුරුෂයා මහළු ය"යි කීවේය. "ඇට අඬ ගසන්නැ"යි එලිෂා කී ය. ඔහු ඇට අඬගැසූ කල ඈ දොරකඩ ළඟට ආවා ය. එවිට ඔහු කතා කොට, "ලබන අවුරුද්දේ මේ කාලය පැමිණි විට ඔබ පුත්‍රයෙකු අතට ගන්නෙහි ය"යි කී ය.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 89: 1–2, 15–18

පිළිතුර : සමිඳුනි, ඔබේ නිරු පෙම ගැන අපි සදහට ම ගයන්නෙමු.

ගීය : සමිඳුනි, ඔබේ නිරු පෙම ගැන මම සදහට ම ගයන්නෙමි.
ඔබේ විශ්වාසවන්තකම පරපුරෙන් පරපුරට පවසන්නෙමි.
ඔබේ නිරු පෙම සදහට ම පවතින බව
මම ඒකාන්තයෙන් ම පිළිගනිමි;
ඔබේ විශ්වාසවන්තකම අහස මෙන් තිරසර බව මම දනිමි.

සම්දුනි, ගී ගයමින් ඔබ නමදින්නෝ ද
ඔබේ කරුණා ආලෝකය තුළ හැසිරෙන්නෝ ද භාග්‍යවන්තයෝ ය.
දවස පුරා ඔව්හු ඔබ අබියස ප්‍රීති ප්‍රමෝද වන්නෝ ය;
ඔබේ දැහැමිකම ගැන වෙසෙසින් පසසන්නෝ ය.

ඔබ අපට මහිමාන්විත ජයග්‍රහණ දෙන සේක.
ඔබේ කරුණාවෙන් ඔබ අපට ජය අත්කර දෙන සේක.
සම්දුනි, ඔබ අපේ ආරක්ෂාකරු අපට තෝරා දුන් සේක.
ඉශ්රායෙල්වරුන්ගේ සුවිශුද්ධ දෙවිඳුන් වන ඔබ
අපේ රජු අපට දුන් සේක.

## දෙවන දේව ප්‍රකාශනය රෝම 6: 3-4, 8-11

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් උපුටා ගත් කොටසකි.*

"බව්තීස්ම-ස්නාපනයේදී අපි ක්‍රිස්තුස් වහන්සේගේ මරණයට ද උත්ථානයට සම්බන්ධ වෙමු."

බව්තීස්ම-ස්නාපනයෙන් ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ හා සමඟ ඒකාබද්ධ වූ අප සියල්ලන් ම එම බව්තීස්ම-ස්නාපනයෙන් උන් වහන්සේගේ මරණයෙහි, උන් වහන්සේ හා සමඟ ඒකාබද්ධ වූ බව ඔබ නොදන්නහු ද? එබැවින් අපේ බව්තීස්ම-ස්නාපනයෙන් අපිත්, උන් වහන්සේගේ මරණයට සම්බන්ධ වී උන් වහන්සේ සමඟ වළලනු ලැබුවෙමු. එසේ කරනු ලැබුවේ පියාණන්ගේ මහිමාන්විත ක්‍රියාවෙන් ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් උත්ථානය ලැබූ සේ ම, අප ද නව ජීවන මඟක ගමන් කරනු සඳහා ය. අපි ක්‍රිස්තුන් වහන්සේ සමඟ මැරුණෙමු නම්, උන් වහන්සේ සමඟ ජීවත් වන බව ද විශ්වාස කරමු. උත්ථාන කරනු ලැබූ ක්‍රිස්තුන් වහන්සේ යළිත් නොමැරෙන බව ද අපි දනිමු. මින් මතු මරණය උන් වහන්සේ කෙරෙහි බල පවත්වන්නේ නැත.

උන් වහන්සේ මරණයට පත් වීමෙන් එක ම වරක් පාපය නිසා මළ සේක: එහෙත් දැන් ජීවත් වන ජීවිතයෙන් දෙවියන් වහන්සේ උදෙසා ජීවත් වන සේක. ඔබත් එසේ ම පාප විමුක්තිය ලත් අය බව ද, ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ දෙවියන් වහන්සේ උදෙසා ජීවත්ව සිටින්නන් බව ද සිතට ගන්න.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද 1 පේදුරු 2: 9

ආලේලූයා! ආලේලූයා!
අන්ධකාරයෙන් ආලෝකයට අප කැඳවාගත් තැනැන් වහන්සේගේ
මහිමාන්විත ක්‍රියා දන්වනු පිණිස
අප වනාහි තෝරාගත් වංශයක් ද,
රාජකීය පූජක පෙළක් ද, ශුද්ධ ජාතියක් ද,
දෙවියන් වහන්සේට කැප වූ සෙනගක් ද වන්නහු ය.
ආලේලූයා!

## සුවිශේෂය මතෙව් 10: 37–42

*සුවිශේෂක මතෙව් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

"සිය කුරුසිය දරාගෙන මා අනුගමනය නොකරන තැනැත්තා
මට සුදුසු නොවේ."

"මට වඩා පියාට වත්, මවුට වත් ප්‍රේම කරන්නා මට සුදුසු නො වේ. මට වඩා පුතාට වත් දුවට වත් ප්‍රේම කරන්නා මට සුදුසු නො වේ. සිය කුරුසිය දරා ගෙන මා අනුගමනය නොකරන තැනැත්තා මට සුදුසු නො වේ. සිය දිවි රැක ගන්නා එය නැති කරගනී. මා නිසා සිය දිවි නැති කර ගන්නා එය රැකගනී. ඔබ පිළිගන්නා මා පිළිගන්නේ ය: මා පිළිගන්නා මා එවූ තැනැන් වහන්සේ පිළිගන්නේ ය. දිවැසිවරයකු වන නිසා දිවැසිවරයකු පිළිගන්නා, දිවැසිවරයකුගේ විපාකය ලබයි: සත් පුරුෂයකු වන නිසා සත් පුරුෂයකු පිළිගන්නා, සත් පුරුෂයකුගේ විපාකය ලබයි. මේ මාගේ ශ්‍රාවකයන්ගෙන් ඉතා සුළු කෙනෙකුට වුව ද ඔහු ශ්‍රාවකයකු වන නිසා බොන්න ඇල් වතුර කෝප්පයක් වත් යමෙක් දෙන්නේ ද, සැබැවින් ම මම ඔබට කියමි, ඔහුගේ විපාකය කිසිසේත් නැති නොවන්නේ ය.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*